# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
## ආබාධිතතා අධ්‍යයන අංශය
## වෛද්‍ය පීඨය
## විශ්වවිද්‍යාල ප්‍රවේශය 2018/2019
## කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආබාධිතතා අධ්‍යයන අංශය විසින් ආරම්භ කර ඇති කථන හා ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධි පාඨමාලාව (කථන හා භාෂා විශේෂවේදී හෝ ශ්‍රවණවිද්‍යා විශේෂවේදී) දැනට ශ්‍රී ලංකාවේ මේ පිළිබඳ ඇති එකම උපාධි පාඨමාලාව වේ. න්‍යායාත්මක පන්ති පදනම් කරගත් ඉගැන්වීම් සහ අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි ප්‍රායෝගික පුහුණුව මෙහි විෂය පථයට අදාල වන අතර මෙම පාඨමාලාව සාර්ථකව නිම කිරීමේදී වාග් චිකිත්සක හෝ ශ්‍රවණ චිකිත්සක ලෙස තම වෘත්තීය නිපුනතාවයන්ට අදාලව විශේෂ පුහුණුවක් ලැබෙනු ඇත. මෙම උපාධි පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වනුයේ සන්නිවේදන අපහසුතා සහිත වූවන් හා ඔවුන්ගේ පවුල් සඳහා පුණරුත්ථාපන සේවා සැපයීම හා සන්නිවේදන අපහසුතාවයන් පිළිබඳව ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම සඳහා දැනුමෙන් ආකල්ප වලින් හා කුසලතාවයන්ගෙන් පරිපූර්ණ වූ වාග් චිකිත්සකවරුන් හා ශ්‍රවණවේදීන් බිහිකිරීමයි.

- මෙය සිව් වසරක උපාධි පාඨමාලාවක් වන අතර මොඩියුල ව්‍යුහයකින් යුත් සම්මාන 120ක පාඨමාලාවකි.
- අවසන් වසර තුල අනිවාර්යය පර්යේෂණ ව්‍යාපෘතියකින් සමන්විතය.
- **සම්පූර්ණ පාඨමාලාවේ මාධ්‍ය ඉංග්‍රීසි පමණක්ම වේ.**
- අ. පො. ස. (උ. පෙළ) භෞතික විද්‍යා විෂය සමත් අයහට පමණක් ශ්‍රවණ විද්‍යා ක්ෂේත්‍රය යටතේ උපාධි පාඨමාලාව සඳහා හැදෑරිය හැකිය.

මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට කැමැත්තක් දක්වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් විය යුතුය. යෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට කැමති අයදුම්කරුවන්ට medicine.kln.ac.lk/shs වෙබ් අඩවියට පිවිස අන්තර්ජාලය හරහා ලියාපදිංචි විය හැකි අතර එසේ ලියාපදිංචි වීමේදී ලැබෙන යොමු අංකය පහත දක්වා ඇති අයදුම්පතෙහි වම් පස ඉහළ කෙලවරෙහි සඳහන් කර අදාල අනිකුත් ලියකියවිලි ද සමග ලියාපදිංචි තැපැලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කල යුතුය.

1. මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින්, ගිණුම් අංක 055100130667553 මහජන බැංකුව, කැලණිය ශාඛාවට රුපියල් (රු. 750/-) බැර කරන ලදුපත.
2. විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු විසින් නිලමුද්‍රාව සමගින් සහතික කරන ලද අ.පො.ස. (උ/පෙළ) 2018 ලකුණු සහිත විභාගවල ප්‍රතිඵල ලේඛන.
3. ඉහත ඕනෑම ලේඛනයක සඳහන් නම් හා අයදුම්පත්‍රයේ සඳහන් නම් අතර වෙනසක් වේ නම් දිවුරුම් පෙත්සමක්.

අයදුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් 2018/2019 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කරන ලද ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි පිටු අංක 102 හි 2.2.8.24 වගන්තිය යටතේ වන පහත සුදුසුකම් සපුරාලිය යුතුය.

i. 2018 වර්ෂයේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේදී ජීව විද්‍යා, භෞතික විද්‍යා හෝ කලා විෂය ධාරාවෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ ("S" Grades) 03ක් ලබාගෙන තිබිය යුතුය.

පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයට සකස් කරන ලද අයදුම්පත් නියෝජ්‍ය ලේඛකාධිකාරී (විභාග) කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය යන ලිපිනයට 2019 පෙබරවාරි මස 15 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවර **කථන හා ශ්‍රවණ විද්‍යා විශේෂවේදී උපාධිය** යනුවෙන් සඳහන් කල යුතුය.

යෝග්‍යතා පරීක්ෂණය 2019 අප්‍රේල් 27 දින පැවැත්වේ.

මෙම යෝග්‍යතා පරීක්ෂණය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ.

නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය
2019.01.30 දින

---

**කැලණිය විශ්වවිද්‍යාලය**

**යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත**

**කථන හා ශ්‍රවණ විද්‍යාවේදී විශේෂ උපාධිය 2018/2019**

(අයදුම්පත පිරවීමේදී ඉංග්‍රීසි කැපිටල් අකුරු පමණක් භාවිතා කරන්න)

1 අයදුම්කරුගේ සම්පූර්ණ නම: ..............................................
..............................................................................................
මයා/මෙනවිය/මිය
2 මුලකුරු සමග නම ඃ
3 ජාතික හැඳුනුම්පත් අංකය ඃ
4 ස්ථිර ලිපිනය ඃ
5 දුරකථන අංක ඃ
6 අයදුම්කරු 2018 වසරේ අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි දිස්ත්‍රික්කය ඃ
7 2018 වර්ෂයේ අ පො ස (උ. පෙළ) විභාගයේ විභාග අංකය ඃ
8 2018 වසරේ අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල ඃ

a. Z ලකුණු ☐ . ☐ ☐ ☐

b. විෂය 01 ................................ සාමාර්ථය :
c. විෂය 02 ................................ සාමාර්ථය :
d. විෂය 03 ................................ සාමාර්ථය :

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. එසේම මෙම පාඨමාලාව සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්ම පවත්වන පාඨමාලාවක් බව මම දැනගෙන සිටිමි.

අයදුම්කරුගේ අත්සන                                   දිනය

---

**සටහන**

i. රු 750/- ක මුදල් තැන්පත් කුවිතාන්සිය සහතික කරන ලද අ. පො. ස. (උ. පෙළ) විභාග ප්‍රතිඵල ලේඛණය හා ප්‍රතිඵල ලේඛනයෙහි නමෙහි වෙනසක් ඇත්නම් එය නිවැරදි බවට දිවුරුම් ප්‍රකාශයක් ඈදිය අමුණා තිබිය යුතුය.

ii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අයදුම්පතෙහි ඔබ විසින් කථන හා ශ්‍රවණ විද්‍යාවේදී විශේෂ උපාධිය හැදෑරීම සඳහා මනාපය සලකුණ කර තිබිය යුතුය.